# Living the LOTUS

## Buddhism in Everyday Life

4
2018
VOL. 151

## FOUNDER'S ESSAY

### සැමෝම ප්‍රියකරන පුද්ගලයෙකු බවට පත්වීමට

වසන්ත කාලයේ අප්‍රේල් මාසය යනු, පාසල් හා රැකියා ස්ථාන වල නව වසර ආරම්භ වන අවධිය බැවින් අළුත් හමුවීම් බහුල කාලයකි. එසේම තරුණ අය රැකියා ස්ථානයේ අළුත් ප්‍රධානීන් හා මිත්‍රයන් සමඟ හොඳින් සබධතාවය පවත්වා ගන්නේ කෙසේද යන්න සිතමින්, 'අන්‍යයන් තමාට ප්‍රිය වෙන ක්‍රමයක් නැතිදෝ' යි හදවතින් පීඩාවට පත්වේ. එසේ වුවද, වඩාත්ම යෝග්‍යය ක්‍රමය නම් තමන් අන්‍යයන්ව හදවතින්ම ප්‍රියකරන කෙනෙකුබවට පත්වීමයි.

ඒ අතරම 'මට ආදරවන්තයෙකු වීමට තවම නොහැකි වන්නේ මන්ද' ලෙස වේදනාවෙන් සිටින අය වුවද, තමාගේ කඩවසම් බව හෝ ලස්සන ගැන පමණක් සිතා කටයුතු කරයි. ඒ වාගේම බොරු මවාපාමින්, බලසම්පන්න කථා කියමින් සිටිනවා මිසක වැදගත්ම දේ වන, අදාල පුද්ගලයා දෙස නොබලයි. සෑම දෙයටම වඩා වැදගත් වන්නේ අදාල පුද්ගලයා ගැන, තමන් කැමැත්තක් ඇතිකර ගැනීම ආදරවන්තයෙකු වීමට තිබෙන කෙටිම මඟ වේ. මන්දයත්, මනුෂ්‍යයන් යනු තමා ගැන ප්‍රසාදයක් හා සිතුවිල්ලක් ඇති කර ගන්නා පුද්ගලයන්ට ස්වභාවයෙන්ම ප්‍රිය කරන පුද්ගලයන් පිරිසක් නිසාය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ස්වරූප 32 කින් දුකින් පීඩාවට පත්වූ පුද්ගලයන්ව දුකින් මුදවා ගන්නා අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් ගැන සදහන් වේ. අවලෝකිතේෂ්වර යනු, අන් අයගේ හදවතට හා අන්‍යයන්ගේ ප්‍රාර්ථනයන්ට සවන්දීම වේ. 'මට චතුර ලෙස කතා කරන්න බැහැ' ලෙස බලාපොරොත්තු අත්හැර ගන්නා අයද සිටියි. 'ආදර වදන' යනු ගොඩාක් කථා කරනවාට වඩා, වැඩිපුර ඇහුම්කන් දීමයි. ඕනෑම කෙනෙකුගේ, ඕනෑම කතාවකට සාවධානව ඇහුම්කන් දීමට හැකිනම්, සැවොම කෙනෙකු ප්‍රිය කරන පුද්ගලයෙකු බවට පත්වීමට හැකිවේ.

*Kaiso zuikan* 9 පි. 34-35

Living the Lotus
Vol. 151 (April 2018)

Rissho Kosei-kai International
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537 Japan
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international
@kosei-kai.or.jp

**Senior Editor:** Koichi Saito
**Copy Editors:** P.A.D. Somapala, G.N. Ruklanthi
**Editor:** Eriko Kanao
Editorial Staff of RK International

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත් , කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන , සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිච්කෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන් , සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවූ ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මගින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවූ සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවූ අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.

*President's Message*

# පරිපූර්ණත්වයෙන් යුතු පුද්ගලයෙකු වීමට



නිචිකෝ නිවානෝ
රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා

## එක් සුභාශිංසනයක් තුලින්

සැමදම උදෑසන ඉතා වැදගත් ආකාරයට සුභාශිංසනය කරන තැනැත්තෙකු එක් කාර්යාලයක සිටියහ. හොඳින් අන් අයගේ මුහුණ දෙස බලමින් 'සුභ උදෑසනක්' ලෙස පවසමින් හිසද පහත් කරයි. එනමුත් ඉතා කාර්යබහුල උදෑසන වේලාවේ ඒ අයුරින් ඉතා වැදගත් ආකාරයට ආචාර කිරීම ගැන මහා කරදරයක් ලෙස සලකන පිරිසක්ද සිටියහ.

කෙසේ නමුත්, ටික කලක් යද්දි රැකියා ස්ථානයේ ස්වරූපය වෙනස් විය. ඒ වෙනතෙක් “Morning” ලෙස ඕනෑවට එපාවට කියාගෙන ගිය පිරිසද, එකිනෙකාගේ මුහුණ දෙස බලමින් සුභාශිංසනය කරන්නට විය. එයින් ආයතනයේ ස්වරූපය සාමකාමි තත්වයට පත්විය.

පරිපූර්ණත්වය යනු, චරිතස්වභාවයෙන් 'නියමාකාරයෙන් අග තැන්පත්, අවගුණයක් හෝ අඩුපාඩුවක් නොමැතිවීම' වේ. එබැවින් 'පරිපූර්ණත්වයෙන් යුතු පුද්ගලයෙකු පුද්ගලයෙකු විම' යනු, මනුෂ්‍යයෙකු ලෙස පරමාදර්ශී බවට පත්වීමය. බෞද්ධයෝ වන අපට නම් බුදුන් වහන්සේ හා සමාන තත්වයට පත්වීම අර්ථ ගැන්වේ. එසේ වූවද එම අරමුණ අපට ළඟාවිය නොහැකි අරමුණක් නොවේ යැයි සිතමි.

මනුෂ්‍යයන්ට සිතේ සැනසීම හා තෘප්තිය ලබාදී, ඒ තුලින් අන්‍යයන් සමඟ 'මිත්‍රශීලි බව' යන හැඟීම ඇතිකර ගෙන, තමා සිටිනා ස්ථානයේ සාමකාමිබව පවත්වා ගැනීම බුදුන් හෝ බෝධිසත්ව ක්‍රියාවලියක් ලෙස භාරගන්නේ නම්, උදෑසන එක් සුභාශිංසනයකින් මනුෂ්‍යයන්ගේ හදවතේ වෙනසක් ඇතිකර, කාර්යාලයේ සාමකාමිත්වය පවත්වා ගන්නා පුද්ගලයන් නිසැකවම පරිපුර්ණත්වයෙන් යුතු පුද්ගලයන් වේ. අපි, අඩුපාඩු වලින් බහුල වූවද සැමදෙනා තුලම එක හා සමානව බුද්ධ ශක්තිය තිබේ. එසේම, මෙම වසන්ත කාලය තුල ඇතිවන නැවුම් සැබැඳියාවන්, පරිපුර්ණ මානුෂීය සැබැඳියාවන් බවට පත්වන තීරණාත්මක සාධකය සුභාශිංසනයන් තුලින් අන් අයගේ බුද්ධ ශක්තියට ගෞරව කිරීම තුල තිබේ.

## දුක හඳුනන මනුෂ්‍යයෙකු වීම

මනුෂ්‍යයෙකුගේ හරය බුද්ධ ශක්තිය වේ. චරිත ස්වභාවයෙන් පරිපූර්ණත්වයට පත්වීමේ උදාහරණ කථා පෙන්වාදෙන්නේ නම් තව බොහොමයක් ඇත.

එදෝ යුගයේ, නරා ප්‍රදේශයේ යොශිනෝ ගමේ ජෝදෝ ධර්ම නිකායේ බැතිමතෙක් වන සෙයිකුරෝ නම් තැනැත්තෙක් වාසය කලහ. දිනක් එම තැනැත්තා නිවසේ නොසිටි අවස්ථාවක හොරෙකු ගෙදරට ඇතුළුවී බඩු භාණ්ඩ සොරකම් කල නමුත්, ඔහු පැවසූවේ, 'මාගේ නිවසට ඇතුළුව සොරකමේ යෙදුනා යනු, ඔහු ඉතා දරිද්‍රත්වයට පත්ව සිටින්නට ඇති. හොද වේලාවට අපේ ගෙදර මුදලුත් තිබී, ඔහුට ගන්නට දෙයක් තිබීම සතුටකි' ලෙසය. එසේම, ''බුදුන් වහන්සේගේ ආශීර්වාදයෙන් 'සොරකමට ලක්වීමට' මට අවස්ථාවක් ලැබීම ගැන සතුටු වෙමි'' ලෙසද පවසා ඇත.

ඒ හා සමාන බැතිමතෙක් වන ඕසකා වල නොනොදනේ කිචිබෙයි මහතාද මෙසේ පවසයි. 'යහපත් අවස්ථාවල සතුටු වීම, ඕනෑම කෙනෙකුට කළ හැකිය. නමුත් කොපමණ දුෂ්කරතාවයන් මුහුණ දුන්නද, එම දුෂ්කරතාවයන්හි හරය' හා එම දුෂ්කරතාවයෙන් කියාදෙන 'කෘතවේදීත්වයේ බීජය' අවබෝධ කර ගැනීමෙන් ලබන සතුට නියම සන්තුෂ්ටිය වනවා සේම, නියම වටිනාකමද ගැබ්වී ඇති බව පවසයි.

ඒ ආකාරයේ පුද්ගලයන්ගේ හදවතෙහි ඇත්තේ, බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් ජීවිතය ගත කිරීමට හැකිවීම ගැන කෘතවේදීත්වය, මෛත්‍රීය කරුණාව හා අන්‍යයන් ගැන සිතීම පමණය. පරිපූර්ණත්වය යනු, චරිතස්වභාවයෙන් 'නියමාකාරයෙන් අග තැන්පත්ව, අඩුපාඩු නැතිවීම' යන අරුතෙන්, කිසිම දෙයක් සිදු නොවුනා සේ සෑමදෙයම 'කෘතවේදියි' ලෙස කෘතවේදීත්වයෙන් භාර ගැනීම තෘප්තියට පත්වීම ලෙසද පැවසිය හැකිය.

ඉහත සදහන් කළ සෙයිකුරෝ මහතාගේ පියා ඉක්මණින් මිය ගොස්, මවද ඉතා දිළිඳු ජීවිතයක් ගත කලහ. විවාහ වු භාර්යාවද වයස අවුරුදු 33 දී මිය ගියහ. දුක වේදනාවේ අත්දැකීම් තුලින් මනුෂ්‍යයන්ගේ හදවතේ වේදනාව අවබෝධ වේ. ඒ තුලින් උපදින මෛත්‍රීයේ හැඟීම මනුෂ්‍යයන්ව දුකින් මුදවා ගන්නා ප්‍රඥාව වේ.

විචාරයකයෙකු වන කත්සුඉචිරෝ කමෙයි මහතා පසන පරිදි, ජපානයේ නරා නගරයේ චුගු විහාරයේ තිබෙන මෛත්‍රිය බෝධිසත්ව පිළිමයේ තිබෙන සැහැල්ලු සිනහව, දුක හා වැළපීමේ සම්මිශ්‍රණයක් වේ. බෝධිසත්වයන් වහන්සේලාගේ හදපත්ලෙහි තිබෙන්නාවු දුක වේදනාව වදන් වලට පෙරලිය නොහැකිය.

Hichi enman
එසේම '悲智 円満 ' (මෛත්‍රිය කරුණාව හා ප්‍රඥාවෙන් පරිපූර්ණවීම) ලෙස ජපානයේ අවදනක් ඇත. බුදුන් වහන්සේ වාගේම, අපත් මෛත්‍රිය කරුණාව හා ප්‍රඥාව අඩුවක් නොමැතිව ඔපමට්ටම් කර ගැනීම සදහා මේ ලෝකයට ප්‍රාර්ථනා කරගෙන බිහිවුනි.

From *Kosei*, April 2018



# The 7 Parables of the Lotus Sutra

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
8 වන පරිච්ඡේදය

## ඇඳුමෙහි වාටියෙහි මැණිකක් සඟවා තැබීමේ උපමාව

### භික්ෂු 500 නමකට විවරණ දීම



එක් ප්‍රදේශයක දිළිඳු ජීවිතයක් ගත කල පුද්ගලයෙක් වාසය කලහ. එක් දිනක් එම තැනැත්තා තමාගේ හිතවත් මිත්‍ර යෙකුගේ නිවසට ගියහ. ඉතා සමෘද්ධිමත් තැනැත්තෙකු වූ ඔහුගෙන් කුස පිරෙන්නට ආහාර පානද ලැබුනි. බඩ පිරෙන්නටම ආහාරගෙන, මත්පැන්ද පානය කර මත්වී වූ එම තැනැත්තා මිත්‍රයාගේ නිවසේ නින්දට ගියහ.



මිත්‍රයාට හදිසි කටයුත්තක් යෙදී නිවසින් පිටවීමට සිදුවිය. ඒ මොහොතේ ඉතා දිළිඳු ජීවිතයක් ගත් කරන මිත්‍රයා ගැන සිතා, ඉතා වටිනා මැණිකක් ඔහුගේ ඇඳුමේ වාටියට තබා මසා ගෙදරින් පිටවිය. එහෙත් මිත්‍ර යාට හොඳටම නින්දගොස් තිබුණ නිසා ඒ ගැන නොතේරුනි.



නින්දෙන් අවධි වූ ඒ තැනැත්තා මිත්‍ර යාගේ නිවසින් පිටත්ව, නැවතත් සුපුරුදු පරිදි කුලී වැඩ කර ලැබූ ආදායමෙන් හැසීමකට පත්විය. නැවතත් එක් දිනක් මිත්‍රයා සමඟ හමුවිය. නමුත් සුපුරුදු පරිදි දිළිඳු ජීවිතයක් ගත කරන එම තැනැත්තාව දැකීමෙන් මිත්‍රයා පුදුමයට පත්වී, ඇඳුමේ වාටියට තබා මැසූ මැණික ගැන පවසා, එය එළියට ගත්හ. එයින් ඉතා සතුටට පත් එම තැනැත්තා, මැණිකේ පිහිටෙන් ඉන් පසු අපහසුතාවයකින් තොරව ජීවිතය ගත කළහ.

## අර්ථ කථාව:

'දිළිඳු ජීවිතයක් ගත කල පුද්ගලයා' අපි වේ. 'මිත්‍රයා' නම් බුදුන් වහන්සේව අර්ථගැන්වේ. එසේම 'වටිනා මැණික' නම් ඒකයානයේ ධර්මය වේ. බුදුන් වහන්සේ දුකින් පීඩාවට පත්ව සිටින මිනිසුන්ව දුකින් මුදවා ගැනීම සඳහා නොයෙක් ධර්ම කරුණු කාරනා දේශනා කලහ. ඒ සියළුම ධර්මය සෑම සියළු පුද්ගලයෙකුටම ධර්මාවබෝධය ලබාදිම සඳහා දේශනා කලදේය. අපි එකිනෙකා විවිධාකාරයි, නොයෙකුත් වෙනස්කම් තිබේ, එබැවින් අපි ගත කරන ජීවන මඟ වෙනස් ලෙස පෙනුනද, සත්‍යලෙසම එකිනෙකා තුල සමාන ලෙස බුද්ධ ශක්තිය තිබෙනවා සේම, මහා ජීව ශක්තියේ ආශිර්වාදයෙන් ජීවතය ගත කිරීමට හැකිව තිබේ. එම ශක්තිය සද්ධර්මය හෙවත් ඒකයානය ලෙස හඳුන්වයි.

අපි නොදැනුවත්වම වටිනා මැණිකක් ළඟ තිබුනා යනු, අපි අපිටත් නොදැනීම බුද්ධ මාර්ගයේ ගමන් කල බවයි.

අපගේ ජීවිතය සදකාලික ස්ථිර පැවැත්මක් නැති, සබැඳියාවන්ට අනුව වෙනස්වීමට ලක්වන වේ. දැසට පෙනෙන අපගේ ස්වරූපය තමාගේ සත්‍යවු ස්වරූපය බවට විශ්වාස කර, බලාපොරොත්තු පොදි බැදගෙන දුකින් පිරුණු ජීවිතක් ගත කරයි. එය මේ කථාවේ සඳහන් වන දිළිඳු මිනිසා මෙනි, එක් වේලාවකට ආහාර හා මත් පැන් වලින් සෑහීමකට පත්වුවත්, තත්වය වෙනස් වු සැනින්, කලින් ගත කල ජීවිතයට ආපසු හැරී, කවදාවත් සෑහීමකට පත් නොවේ.

එහිදී, බුදුන් වහන්සේ හේතුඵලවාදය දේශනා කර, අපගේ ආශාවන්ට මන්මුලා නොවී, හදවත සන්සුන් කර ගැනීමට මඟ පෙන්වයි. ඒ බව මේ කථාවේ එදිනෙද ජීවිතය පවත්වා ගැනීමට රැකියාව කර ලැබෙන්නාවු සුළු මුදලින් තෘප්තිමත්ව ජීවිතය ගත කරනවා හා සමානය.

නැවතත් මිත්‍රයා හමුවු විට, වටිනා මැණික සඟවා තැබීම ගැන පැවසීම යනු, බුදුන් වහන්සේ විසින් අපට, 'ඔබටත් ධර්මාවබෝධය ලබා ගැනීමට පුළුවනි' ලෙස විවරණ ලබාදීම පෙන්වයි.

බුදුන් වහන්සේගෙන් ලැබුණ වටිනා මැණික, තමාට පමණක් සීමාවු සිත සැහැල්ලුවට පත් කර ගැනීමේ තත්වයක් නොව්. ඉතා වටිනා මැණික, එනම් ඒකයානයේ ධර්මය වේ. එම ධර්මයට අනුව, අප ගමන් ගන්නා මාර්ගය, සත්‍ය ලෙසම බුද්ධ මාර්ගයට සම්බන්ධ වන බව අවබෝධ කර ගත යුතුය. ධර්මාවබෝධය ලබා ගැනීමේ මාර්ගය යනු, අන් අයගේ සතුට ප්‍රාර්ථනා කර, ඒ වෙනුවෙන් කටයුතු කිරීම (බෝධිසත්ව මාර්ගය) වේ. ඒ ආකාරයේ ජීවිතයක් ගත කිරීම, බුද්ධ ශක්තියෙන් යුතුව මේ ලොවට බිහිවු අපගේ නියම ස්වරූපය වේ. වටිනා මැණික පිළිබඳ අවබෝධ කර ගැනීමම, අප සිටින්නාවු ස්ථානය ආලෝකයට පත් කිරීමයි. ඒ දිප්තියෙන් බැබලෙන වටිනා මැණිකක්, දැනටමත් අපගේ හදවත තුල තිබෙන නිසා.

සංස්කරණ සහය Chuo Academic Research Institute







## සුභාශීංසනයන් යනු බුද්ධ ශක්තියට ගෞරව කිරීමේ ක්‍රියාවලියයි

පසුගිය දවසක හකොනේ මැරත්න් තරඟාවලියේ 4 වන වරටත් ජයගත් අඔයම ගකුයින් විශ්වවිද්‍යාල මලල ක්‍රීඩා කණ්ඩායම ජයගත් බැවින්, ඒ පිළිබඳ අදහස් ධාවන අංශ ප්‍රධානී වන උචියමා ගුරුතුමාගෙන් අදහස් විමසා සිටියා. එහිදී එතුමා පැවසූවේ, ක්‍රීඩකයන් නිර්මාණය කිරීමේදී හොඳ ධාවන වාර්තාවන් බිහිකළ හැකි ක්‍රීඩකයන් සෑදීම වැදගත් වාගේම, ඊටත් වඩා ගතිගුණ හා ආධ්‍යාත්මික අතින් දියුණු ක්‍රීඩකයින් බිහි කිරීම ඉතා වැදගත් යැයි සිතන බවයි.

එසේම සියළුදෙනාම එකතුව 'නිතරම සුභාශිංසනය කිරීම, සපත්තු සෙරප්පු පිළිවෙලට තැබීම, නේවාසිකාගාරය අවට පිරිසිදු කිරීම' ආදී නීති රීති මාලවක් නිර්මාණය කලහ. ඒ අනුව කටයුතු කිරීම තුලින්, අන් අය ගැන සිතන්නාවූ හැඟීම් වර්ධනය වනවා වාගේම, කණ්ඩායමක් ලෙස නියමාකාරයට කටයුතු කිරීමට හැකිවුන බව සිතමි. රි.කෝ.ස. අපටත් සුභාශිංසනය ලෙස 'තෙවදෑරුම් ක්‍රියාවලිය' කියදී ඇත. නැවත වරක් එහි වටිනාකම දැනුනි. අපිත් නිකම්ම එදිනෙද සුභාශිංසනයන් නොකර, අන් අය ගැන සිතා හදවතින්ම ප්‍රයෝගික පුහුණුවේ යෙදිය යුතු යැයි සිතමි.

රි.කෝ.කා. අන්තර්ජාතික මුලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා




## RISSHO KOSEI-KAI INTERNATIONAL BRANCHES

We welcome comments on our newsletter *Living the Lotus*: living.the.lotus.rk-international@kosei-kai.or.jp

Rissho Kosei-kai

# Overseas Dharma Centers 2018

**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street Suite #1 Los Angeles CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way,
WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, USA
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel*: (727) 560-2927 *e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona,
HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951 *Fax:* 1-650-359-6437
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/˜rkchi/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai, Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100 Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Taichung**

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701 Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Rissho Kosei-kai of Pingtung**

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Rissho Kosei-kai of South Asia Division**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Central Delhi**
224 Site No.1, Shankar Road, New Rajinder Nagar, New Delhi,
110060, India

**Rissho Kosei-kai of West Delhi**
66D, Sector-6, DDA-Flats, Dwarka, New Delhi 110075, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna Dharma Center**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218 *e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station: Mirshari,
District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax*: 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Other Groups**

**Rissho Kosei-kai Friends in Shanghai**